**රාජ්‍ය සේවකයන් විසින් ලබා ගත් දේපළ ණය මුදලේ ශේෂය ණය ඇපකර අරමුදලෙන් පියවීම සඳහා හිමිකම් පෑමට අදාළ තොරුතුරු GFLSMS පද්ධතිය ඔස්සේ ලබා ගැනීම**

ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11 වගන්තියට අනුකූලව ලබා ගත් දේපළ ණය ගෙවා නිම කිරීමට පෙර සේවා කාලය තුළ දී මිය ගිය හෝ පූර්ණ අකර්මණ්‍යතාවයට පත් වූ හෝ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද නිලධාරින්ගේ දේපළ ණය ශේෂය ඇපකර අරමුදලෙන් පියවීමේ කටයුතු භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

එම ක්‍රියාවලියට අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම් ඊට සම්බන්ධිත පාර්ශ්වයන් වෙත පහසුවෙන් දැන ගැනීමට GFLSMS පද්ධතිය සකස් කර ඇත. ඒ සඳහා මුදල් අමාත්‍යාංශ නිල වෙබ් අඩවිය ඔස්සේ ප්‍රවේශ වීමට හැකිය.

ඇපකර අරමුදලෙන් හිමිකම් පෑ හැකි අවස්ථා ;

- රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ 2005 වර්ෂයෙන් පසු රජයේ බැංකු මඟින් දේපළ ණය ලබාගත් නිලධාරියකු/නිලධාරිණියක වීම
- සක්‍රිය සේවා කාලය තුලදී නිලධාරියා/නිලධාරිණිය මිය යාම
- සක්‍රිය සේවා කාලය තුලදී නිලධාරියා/නිලධාරිණිය පූර්ණ අකර්මනාෘතාවයට පත්වීම
- වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීම

ඇපකර අරමුදලෙන් හිමිකම් පෑ නොහැකි අවස්ථා ;

- නිලධාරියා/නිලධාරිණිය සේවයෙන් ඉල්ලා අස්වීම, සේවය හැරයාම, සේවයෙන් පහ කිරීම හෝ වැඩ තහනමකට ලක්වීම

**ණය ශේෂය පියවීමේ ක්‍රියාවලිය පහත පරිදි වේ.**

(i) ආයනත ප්‍රධානීන් විසින් තම ආයතනයේ සේවයේ යෙදෙමින් සිටියදී මිය ගිය හෝ පූර්ණ අකර්මණ්‍යතාවයට පත් වූ හෝ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද නිලධාරීන්/නිලධාරිණියන් ඇපකර අරමුදල යටතේ හිමිකම් පෑමට සුදුසුකම් ලබයි නම්, ( ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 11.8 වගන්තිය ප්‍රකාරව) ඔවුන්ගේ කලත්‍රයා/ යැපෙන්නන්ගෙන් අවශ්‍ය තොරතුරු ලබාගෙන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත පහත දක්වා ඇති තොරතුරු යොමු කළ යුතුය.

   - නිලධාරියාගේ ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද ජායා පිටපතක්
   - නිලධාරියාගේ මරණ සහතිකයේ සහතික කළ පිටපත
   - නිලධාරියා වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීමේ නිරීක්ෂණ ඇතුළත් වෛද්‍ය මණ්ඩල වාර්තාවේ සහතික පිටපත
   - වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද ලිපියේ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද පිටපත
   - විධිමත්ව නිකුත් කළ විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ සහතික පිටපතක්
   - වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන්වීමෙන් අනතුරුව නැවත මේවන විට සේවයේ පිහිටුවීමක් සිදුකර නොමැති බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ ලිඛිත ප්‍රකාශයක්
   - නමේ යම් වෙනසක් පවතී නම් දිවුරුම් ප්‍රකාශය

- ආයතන සංග්‍රහයේ 26 වෙනි පරිශිෂ්ඨය අනුව ආයතන ප්‍රධානියා විසින් අනුමත කර බැංකුවට යවන ලද ණය අයදුම්පතේ සහතික කල පිටපතක්
- අදාල නිලධාරියා මිය යන විට එම නිලධාරියා සේවය හැරයාම, සේවයෙන් පහ කිරීම, වැඩ තහනමකට ලක්ව සිටීම, වැටුප් රහිත නිවාඩු ලබා සිටීම හා සේවයෙන් විශ්‍රාම ගන්වා සිටියේ ද නැති ද යන බව ආයතන ප්‍රධානියා විසින් සහතිකය
- මිය ගිය / වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද / පූර්ණ අකර්මන්‍යතාවයට පත්වූ නිලධාරියාගේ වැටුපෙන් මේ දක්වා අයකරන ලද ණය වාරික හා පොලිය පිළිබඳව වාර්ෂිකව ශේෂ කරන ලද මාසික විස්තර වාර්තාව (අදාළ ආකෘතිය අනුව)

| වර්ෂය | මාසය | නිලධාරියාගේ අයකල වාරික මුදල(ප්‍රාග්ධන කොටස) | නිලධාරියාගේ අයකල පොලිය | රජය විසින් ගෙවා ඇති පොලිය | එකතුව |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| එකතුව | | | | | |

- නිලධාරියා මිය ගිය / වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද / පූර්ණ අකර්මන්‍යතාවයට පත්වූ දිනට නොපියවූ ණය මුදලේ ශේෂය (පොලිය හැර)
- මිය ගිය නිලධාරියාගේ කලත්‍රයාගේ හෝ යැපෙන්නෙකුගේ නම, ලිපිනය හා සම්බන්ධ විය හැකි දුරකථන අංකය
- කලත්‍රයා බවට සහතික කිරීම සඳහා විවාහ සහතිකයේ සහතික කල පිටපත
- යැපෙන්නෙක් බවට තහවුරු කල හැකි ලියවිලි

(ii) එම තොරතුරු ලැබුණු පසු ණය ලබා ගත් බැංකුව මඟින් පහත තොරතුරු කැඳවීම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මඟින් සිදු කරයි.

- ණය පියවීම සම්බන්ධයෙන් බැංකු කළමණාකරුගේ ඉල්ලීම් ලිපිය
- ණය පියවීම සම්බන්ධයෙන් ණයකරුගේ කලත්‍රයාගේ/උරුමකරුවන්ගේ ඉල්ලීම් ලිපිය
- මියගිය නිලධාරියාගේ මරණ සහතිකයේ සහතික කළ පිටපත
- නිලධාරියා වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද ලිපියේ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද පිටපත
- නිලධාරියාගේ ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද ඡායා පිටපතක්
- ණයකරුගේ දේපළ ණය මුදලට අදාළ බැංකු ගිණුම් අංකය
- මියගිය / වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද / පූර්ණ අකර්මන්‍යතාවයට පත්වූ නිලධාරියාගේ වැටුපෙන් මේ දක්වා අයකරන ලද ණය වාරික හා පොලිය පිළිබඳව වාර්ශිකව ගෙවීම් කරන ලද මාසික විස්තර වාර්තාව ( අදාළ ආකෘතිය ප්‍රකාරව)

| වර්ෂය | මාසය | නිලධාරියාගේ අයකල වාරික මුදල(ප්‍රාග්ධන කොටස) | නිලධාරියාගේ අයකල පොලිය | රජය විසින් ගෙවා ඇති පොලිය | එකතුව |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| එකතුව | | | | | |

- ආයතන සංග්‍රහයේ 27 වෙනි පරිශිෂ්ඨය අනුව බැංකුව විසින් ආයතනයට යවන ලද ලිපියේ සහතික පිටපත
- ඇපයට තබන ලද දේපළ ඔප්පුවේ සහතික පිටපත
- දේපළ ඔප්පුව අයිති වන්නේ කලත්‍රයාට නම් විවාහ සහතිකයේ සහතික කළ පිටපත
- උකස් ඔප්පුවේ සහතික පිටපත
- ණය මුදල ලබා දී ඇත්තේ නිවසක් ඉදිකිරීමට හෝ නිවසේ ඉතිරි වැඩ නිම කිරීම සඳහා නම් ණය මුදල ඇස්තමේන්තු ප්‍රකාරව යොදවා ඇති බවට බැංකු කළමණාකරුගේ සහතිකය
- ආයතන සංග්‍රහයේ 26 වෙනි පරිශිෂ්ඨය අනුව ආයතන ප්‍රධානියා විසින් අනුමත කර බැංකුවට එවන ලද ණය අයදුම්පතේ සහතික කල පිටපත
- නිලධාරියා මියගිය / වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගන්වන ලද / පූර්ණ අකර්මන්‍යතාවයට පත්වූ දිනට නොපියවූ ණය මුදලේ ශේෂය (පොලිය හැර)

(iii) ඉහත තොරතුරු සියල්ල නිවැරදි ව ලැබුණු පසු සේවා ආයතනය හා බැංකුව විසින් එවන ලද අවකරණ වාර්තා සංසන්දනය කර නිලධාරියා / නිලධාරිණිය මිය ගිය දිනට / පූර්ණ අකර්මන්‍යතාවයට පත්වූ දිනට / වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගන්වන ලද දිනයට තහවුරු වන ණය මුදලේ (ප්‍රාග්ධන මුදලේ) අවම ණය ශේෂය පියවීමට අදාළ චෙක් පත නිලධාරියා නමින් ඇති ණය ගිණුමට බැර කිරීම සඳහා බැංකුව වෙත යොමු කරයි.

(iv) ඒ අනුව අදාළ බැංකුව විසින් දේපළ ණය වෙනුවෙන් ඇපයට තබා ගත් දේපළ ඔප්පුව නිලධාරියා/නිලධාරිණිය වෙත හෝ ඔවුන්ගේ කලත්‍රයා/ යැපෙන්නන් වෙත නිදහස් කිරීම සිදු කරයි.

මෙම ක්‍රියාවලියට අදාළව යම් නිලධාරියකුට/නිලධාරිණියකට අදාළ ණය පියවීම සඳහා ඉල්ලීමක් ලැබුණු පසු අදාළ තොරතුරු භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් GFLSMS පද්ධතියට ඇතුළත් කරන අතර එම ශේෂය පියවීමේ කටයුතු අවසන් වන තෙක් ඉල්ලීම සම්බන්ධයෙන් යාවත්කාලීන තොරතුරු පද්ධතිය ඔස්සේ පරීක්ෂා කළ හැකිය. ණයකරුගේ ජාතික හැඳුනුම්පත් අංකය GFLSMS පද්ධතියට ඇතුළත් කිරීමෙන් තොරතුරු ලබා ගත හැකිය.

මෙම GFLSMS පද්ධතිය, ඇපකර අරමුදලෙන් හිමිකම් පෑ හැකි සේවාලාභින්ට/ සේවා ආයතන හා ණය ලබා දී ඇති බැංකු වෙත පහසුවෙන් හා කාර්යක්ෂමව යාවත්කාලීන තොරුතුරු ලබා ගැනීමේ පහසුකම සැලසීම සඳහා සකස් කර ඇත.

**අධ්‍යක්ෂ ජනරාල්**
**භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව**
**011-2484729**